# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2017 අංක 1 දරන වෛද්‍ය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2017 පෙබරවාරි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 පෙබරවාරි මස 23 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 9.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

**2017 අංක 1 දරන වෛද්‍ය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2017 පෙබරවාරි මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 64/2007

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2017 අංක 1 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 20 වන වගන්තිය, එම වගන්තියේ (5ආ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 105 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(5ඇ) 43අ වගන්තිය යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා ස්වකීය හිමිකම සනාථ කරන සෑම තැනැත්තකුගේ ම නම රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ලේඛනයේ වෙනම කොටසක ඇතුළත් කරනු ලැබිය යුතු අතර, ඉන්පසු 43 වන වගන්තිය යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් එම තැනැත්තා ලියාපදිංචි කරනු ලැබුයේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් එම තැනැත්තාගේ නම දන්ත වෛද්‍යවරුන් වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී ඇති තැනැත්තන්ගේ නම් ඇතුළත් ඉහත සඳහන් ලේඛනයේ එම කොටසින් ඉවත් කරනු ලැබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ ''අභිඥන පත්‍රයක් දරන්නේ නම් මිස,'' යන වචන වෙනුවට ''අභිඥන පත්‍රයක් දරන්නේ නම්, සහ 43අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරන ලද සහතික පත්‍රයක් දරන්නේ නම් මිස,'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (1අ) උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:-

2—PL 010187—2,861 (2016/09)

''(ඇ) වෛද්‍ය සභාව විසින් තත් කාර්යය සඳහා නියම කරනු ලැබූ විශේෂ පරීක්ෂණයෙන් සමත් වී තිබේ නම්; සහ

(ඈ) 43අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරන ලද සහතික පත්‍රයක් දරන්නේ නම්,'';

(3) එහි (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

''(2) දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා වූ ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමේ දී ගෙවනු ලැබිය යුතු නියමිත මුදල් ප්‍රමාණයක් වන්නේ ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියට 43අ සහ 43ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 43අ සහ 43ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :-

''දන්ත වෛද්‍යවරුන් ලෙස තාවකාලිකව ලියාපදිංචි වීම.

43අ. (1) (3) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාවෙන් සහතික පත්‍රයක් ලබා ගැනීම පිණිස අවශ්‍ය යම් පළපුරුද්ද අත්කර ගැනීමේ කාර්යය සඳහා පමණක්, යම් තැනැත්තකු -

(අ) මනා චරිතයකින් යුක්ත වන්නේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම්; සහ

(ඇ) (i) ලංකා විශ්වවිද්‍යාලයේ හෝ අනුරූපී විශ්වවිද්‍යාලයක හෝ උපාධි ප්‍රදාන ආයතනයක දන්ත ශල්‍ය වෛද්‍ය උපාධියක් දරන්නේ නම්; හෝ

(ii) ලංකා විශ්වවිද්‍යාලයේ හෝ අනුරූපී විශ්වවිද්‍යාලයක හෝ උපාධි ප්‍රදාන ආයතනයක දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබා ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණය සමත් වී තිබෙන නමුත්, ඒ උපාධිය

ඔහු වෙත පිරිනැමීමෙහි ලා ඒ විශ්වවිද්‍යාලයේ හෝ උපාධි ප්‍රදන ආයතනයේ ප්‍රමාදයක් හේතු කොටගෙන ඔහු උපාධිය ලබා ගෙන නොමැති නම් හෝ ඒ උපාධිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සීමාවාසික කාලය ඔහු විසින් සම්පූර්ණ කොට නොතිබීමේ හේතුව මත ඔහු ඒ උපාධිය ලබා ගෙන නොමැති නම්; හෝ

(ඈ) (i) ශ්‍රී ලංකාව හැර, වෙනත් යම් රටක විශ්වවිද්‍යාලයක හෝ දන්ත වෛද්‍ය විද්‍යාලයක, දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යාපනයේ මට්ටම කෙරෙහි සැලකිල්ල ඇතිව, මේ වගන්තියේ කාර්ය සඳහා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලැබූ ඒ විශ්වවිද්‍යාලයෙන් හෝ දන්ත වෛද්‍ය විද්‍යාලයෙන් ලබාගත් දන්ත ශල්‍ය වෛද්‍ය උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් දරන්නේ නම්; හෝ

(ii) ශ්‍රී ලංකාව හැර, වෙනත් යම් රටක විශ්වවිද්‍යාලයක හෝ දන්ත වෛද්‍ය විද්‍යාලයක දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යාපනයේ මට්ටම කෙරෙහි සැලකිල්ල ඇතිව, මේ වගන්තියේ කාර්ය සඳහා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලැබූ, ඒ විශ්වවිද්‍යාලයෙන් හෝ දන්ත වෛද්‍ය විද්‍යාලයෙන් දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණය සමත් වී තිබෙන නමුත්, ඒ උපාධිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සීමාවාසික කාලය ඔහු විසින් සම්පූර්ණ කර නොතිබීමේ හේතුව මත ඔහු ඒ උපාධිය ලබා ගෙන නොමැති නම් සහ ඒ සීමාවාසික කාලය ශ්‍රී ලංකාවේ දී සම්පූර්ණ කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඔහුට අවසර දී තිබේ නම්; සහ

(iii) වෛද්‍ය සභාව විසින් තත් කාර්ය සඳහා නියම කර ඇති විශේෂ පරීක්ෂණයෙන් සමත් වී තිබේ නම්,

තමා දන්ත වෛද්‍යවරයකු ලෙස තාවකාලිකව ලියාපදිංචි කරනු ලැබීම සඳහා වෛද්‍ය සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) දන්ත වෛද්‍යවරයකු ලෙස තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා නියමිත ගාස්තුව, ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) දන්ත වෛද්‍යවරයකු ලෙස තාවකාලිකව ලියාපදිංචි වී සිටින තැනැත්තකු මේ වගන්තිය යටතේ සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා වෛද්‍ය සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක සහ වෛද්‍ය සභාවට පිළිගත හැකි සීමාවාසික කාලය පිළිබඳ සහතිකයක් සහ ඇගයීමේ සහතිකයක් ඉදිරිපත් කිරීම මත, එම තැනැත්තා-

(i) අනුමත ආරෝග්‍යශාලා හෝ ආයතන එකක හෝ ඊට වැඩි ගණනක නියමිත කාලයක් සඳහා සේවයේ නියුක්තව සිට ඇති බවට;

(ii) (i) වන අනුඡේදයේ සඳහන් පරිදි ඔහු සේවයේ නියුක්තව සිටිය දී යම් අනුමත ක්ෂේත්‍රයක අනුමත කාලයක් සඳහා දන්ත වෛද්‍ය වෘත්තියෙහි නියැලී ඇති බවට; සහ

(iii) එසේ සේවයේ නියුක්තව සිටියදී සතුටුදායක සේවයක් ඉටුකර ඇති බවට,

වෛද්‍ය සභාව සෑහීමකට පත්වන අවස්ථාවක 43 වන වගන්තිය යටතේ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරන පළපුරුද්ද එම තැනැත්තා ලබා ඇති බවට වෛද්‍ය සභාව සෑහීමට පත්වන බවට නියමිත ආකෘතියෙන් වූ සහතික පත්‍රයක් වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(ආ) 43 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති උපාධියක් දරන්නා වූ ද, ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත අනුමත ආරෝග්‍යශාලා හෝ ආයතන එකක හෝ ඊට වැඩි ගණනක නිශ්චිත කාලසීමාවක් සඳහා දන්ත වෛද්‍ය වෘත්තියෙහි සේවයේ නියුක්තව සිට ඇත්තා වූ ද යම් තැනැත්තකුට, මේ ආඥාපනත මගින් නියම කර ඇති පරිදි එම තැනැත්තා සේවයේ නියුක්තව සිටි කාලය තුළ යම් අනුමත ක්ෂේත්‍රයක දන්ත වෛද්‍ය වෘත්තියෙහි නියැලී සිට ඇති බවට වෛද්‍ය සභාව සෑහීමකට පත් වන්නේ නම්, වෛද්‍ය සභාව විසින් (අ) ඡේදය යටතේ සහතිකයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා -

''අනුමත ආරෝග්‍යශාලාව හෝ ආයතනය'' යන්නෙන්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෛද්‍ය සභාවට ඉදිරිපත් කර ඇති ආරෝග්‍යශාලාවල සහ ආයතනවල ලැයිස්තුවෙන්, වෛද්‍ය සභාව විසින් අනුමත කරන ලද ආරෝග්‍යශාලාවක් හෝ ආයතනයක් අදහස් වේ;

''අනුමත කාලසීමාව'' යන්න, දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ අනුමත ක්ෂේත්‍රවල වෘත්තියෙහි නියැලීමට අදාළව යෙදෙන විට, රටේ වෛද්‍ය අවශ්‍යතා කෙරෙහි සැලකිල්ල ඇතිව වෛද්‍ය සභාව විසින් අනුමත කරන ලද කාලසීමාවක් අදහස් වේ;

''අනුමත ක්ෂේත්‍ර'' යන්නෙන්, මුඛ හනුක වක්ත්‍ර ශල්‍ය විද්‍යාව, විකලාංග දන්ත ශල්‍ය විද්‍යාව සහ දන්ත සංරක්ෂණ ශල්‍ය විද්‍යාව අදහස් වේ;

''සීමාවාසික කාලය පිළිබඳ සහතිකය'' යන්න, දන්ත වෛද්‍යවරයකු ලෙස තාවකාලිකව ලියාපදිංචි වී ඇති තැනැත්තකුට අදාළව යෙදෙන විට, නේවාසික තත්ත්වයෙන් එම තැනැත්තා සේවයේ නියුක්තව සිටි අනුමත ආරෝග්‍යශාලාවේ හෝ ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කරන ලද, එම තැනැත්තා සේවයේ නියුක්තව සිටි කාලසීමාව නිශ්චිතව දක්වන සහතිකයක් අදහස් වේ;

''ඇගයීමේ සහතිකය'' යන්න, දන්ත වෛද්‍යවරයකු ලෙස තාවකාලිකව ලියාපදිංචි වී ඇති තැනැත්තකුට අදාළව යෙදෙන විට, නේවාසික තත්ත්වයෙන් එම තැනැත්තා සේවයේ නියුක්තව සිටි අනුමත ආරෝග්‍යශාලාවේ හෝ ආයතනයේ ප්‍රධානියා විසින් අත්සන් කරන ලද, එම තැනැත්තා යම් අනුමත ක්ෂේත්‍රයක දන්ත වෛද්‍ය වෘත්තියෙහි නියැලී සිටි කාලසීමාව නිශ්චිතව දක්වන සහතිකයක් අදහස් වන අතර, එම එක් එක් ක්ෂේත්‍රයෙහි එම තැනැත්තාගේ කාර්ය සාධනය පිළිබඳ ඇගැයීමක් ද ඊට ඇතුළත් වේ.

දන්ත වෛද්‍යවරුන් වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී සිටින තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

43ආ. 43අ වගන්තිය යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී සිටින සෑම තැනැත්තකුට ම -

(අ) 43අ වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් පරිදි, සේවයේ නියුක්තව සිටීමේ කාර්යය සඳහා පමණක්, අනුමත ක්ෂේත්‍රවල දන්ත වෛද්‍ය වෘත්තියේ නියැලීමට;

(ආ) ඒ සේවයේ නියුක්තව සිටීමේ නියම යටතේ ඔහුට හිමිකමක් තිබෙන්නා වූ, යම් පාරිශ්‍රමික හෝ ගාස්තු අධිකරණයක දී අයකර ගැනීමට; සහ

(ඇ) දන්ත වෛද්‍ය වෘත්තියේ නියැලීම සඳහා වූ සුදුසුකමක් බව හැඟෙන යම් නාමයක් හෝ අභිධානයක් භාවිත කිරීමට,

අයිතිවාසිකම තිබෙන නමුත් 43 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ දන්ත වෛද්‍යවරයකුට ඇති වෙනත් අයිතිවාසිකම්, වරප්‍රසාද හෝ පරිහාර කිසිවකට හිමිකම් නොලබන්නේ ය.''.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.